**මතුගම අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**13 ශ්‍රේණිය** **කාලය පැය 03**

## නාට්‍ය හා රංග කලාව (සිංහල)
## ( II පත්‍රය )

### I කොටස

❖ නිවැරදි පිළිතුර තෝරා ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

**(01)** ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රථම නළුවා, අධ්‍යක්ෂකවරයා ලෙස සලකනු ලබන්නේ, ( )

I) තෙස්පිස් II) සොෆොක්ලීස් III) යුරිපිඩීස්
IV) ඇරිස්ටොෆානීස් V) ඇරිස්ටෝටල්

**(02)** ග්‍රීක ගායන වෘන්දය හැඳින්වූ නාමය වන්නේ, ( )

I) ඩිතිරුම්බය II) ඔකෙස්ට්‍රාව III) පැරඩෝස්
IV) එපිසිනියම් V) පැරස්කිනියා

**(03)** ග්‍රීක නාට්‍ය කලාව තුල අර්ධ සත්ත්ව අර්ධ මිනිස් චරිත භාවිතා වූ රංග සම්ප්‍රදාය වනුයේ, ( )

I) ශෝකාන්ත II) සැටුර III) ප්‍රහසන IV) අභූතරූපී
V) විකාර රූපී

**(04)** ග්‍රීක රංග භූමිය තුල තිබූ දෙමහල් ගොඩනැගිල්ල හඳුන්වන නාමය වන්නේ, ( )

I) දෙමහල් ගොනැගිල්ල II) අල්තාරය III) ප්‍රැජන්ට් වේදිකාව
IV) ස්කීන V) ප්‍රොසිනියම්

**(05)** ඇරිස්ටෝටල් නාට්‍යයේ වැදගත්ම අංගය ලෙස සලකන ලද්දේ, ( )

I) කථා වින්‍යාසය II) සංවාද III) චින්තනය IV) චරිත
V) ප්‍රේක්ෂාව

**(06)** 'සකලජන' (Everyman) යනු, ( )

I) ප්‍රාතිහාර්ය නාට්‍යයක් II) අභූතරූපි නාට්‍යයකි III) සදාචාර නාට්‍යයකි
IV) අද්භූත නාට්‍යයකි V) විකාරරූපි නාට්‍යයකි

**(07)** "ගැටුමක් නොමැති තැන නාට්‍යයක්ද නොමැත" යන්න පැවසූ බටහිර විචාරකයා වන්නේ, ( )

I) ස්ටැනිස්ලවුස්කි II) බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් III) සැමුවෙල් බෙකට්
IV) හෙන්රික් ඉබ්සන් V) ඇරිස්ටෝටල්

(08) මධ්‍යකාලීන යුගයේ පැවති නාට්‍ය පොදුවේ හඳුන්වන නාමය වන්නේ, ( )

I) එලිසබතන් යුගයේ නාට්‍ය II) ෂේක්ෂ්පියරියානු නාට්‍ය
III) ප්‍රාතිහාර්ය නාට්‍ය IV) ජන වන්දනා නාට්‍ය V) ජන නාටක

(09) ෂේක්ෂ්පියර්ගේ ට්‍රැජඩි නාට්‍ය සඳහා විශේෂයෙන් ඉවහල් වූයේ, ( )

I) ග්‍රීක ට්‍රැජඩි II) සැටුර නාට්‍ය III) සිනෙකාගේ නාට්‍ය
IV) මිනැන්ඩරිගේ නාට්‍ය V) ඇරිස්ටොෆානිස්ගේ නාට්‍ය

(10) මුල්ම මධ්‍යකාලීන යුගයේ ඉදිරිපත් කරන ලද නාට්‍යයක් සේ සැලකෙනුයේ, ( )

I) පළමු එඬේරාගේ කථාව II) දෙවන එඬේරාගේ කථාව
III) මරියවරුන් තිදෙනාගේ කථාව IV) සකලජන V) නොඅගේ කථාව

(11) මධ්‍යකාලීන යුගයේ පසුකාලීනව බිහි වූ චක්‍ර නාට්‍ය සඳහා නොගැලපෙන පිළිතුර වන්නේ,
( )

I) ප්‍රැජන්ට් වේදිකාව II) සාන්තුවර කථා III) පූජක නළුවන්
IV) යන්ත්‍ර සූත්‍ර භාවිතය V) ඉහත කිසිවක් නොවේ.

(12) බයිබලය හා ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ අවස්ථා නාට්‍ය සඳහා යොදා ගත් නාට්‍ය වර්ගය වූයේ, ( )

I) මිස්ටරි II) මිරකල් III) මොරැලිම්
IV) සැටුර V) ප්‍රහසන

(13) පශ්චාත් දෘෂ්ටි කථන රීතිය හඳුන්වා දෙනු ලැබුවේ, ( )

I) හෙන්ඩ්‍රික් ඉබ්සන් II) ස්ටැනිස්ලවුස්කි III) විලියම් ශේක්ෂ්පියර්
IV) තොමස් කයිඩ් V) ඇරිස්ටෝටල්

(14) "මිඩ් සමර් නයිට් ඩ්‍රීම්ස්" (Mid Summer Night Dreams) නාට්‍යයේ නිර්මාණකරු වන්නේ, ( )

I) තොමස් කයිඩ් II) විලියම් ශේක්ෂ්පියර් III) ජෝන් ලයිලි
IV) හෙන්ඩ්‍රික් ඉබ්සන් V) රොබට් ග්‍රීන්

(15) එලිසබතියානු යුගයේ නාට්‍යකරුවකු නොවන්නේ, ( )

I) සැමුවෙල් බෙකට් II) විලියම් ශේක්ෂ්පියර් III) ජෝන් ලයිලි
IV) තෝමස් කීඩ් V) ක්‍රිස්ටෝපර් මාලෝ

(16) ශේක්ෂ්පියර්ගේ නාට්‍ය වර්ගයක් ලෙස සැලකිය හැකි වන්නේ, ( )

I) ඓතිහාසික නාට්‍ය II) අභූතරූපී නාට්‍ය III) විකාරරූපී නාට්‍ය
IV) සදාචාර නාට්‍ය V) ප්‍රාතිහාර්ය නාට්‍ය

(17) ශේක්ෂ්පිරියානු යුගයේ ඛේදාන්ත නාට්‍යයක් නොවන්නේ, ( )

I) මැක්බර්ත් II) ඔතෙලෝ III) හැම්ලට් IV) ජුලියස් සීසර්
V) ටුවෙල්ත් නයිට්

(18) ඊඩිපස් රජ නාට්‍ය සඳහා වස්තු විෂයය කරගනු ලැබුවේ, ( )

I) සාන්තුවරයන්ගේ කථා II) සෙනකාගේ කථා III) ඔඩෙසි හා ඉලියට් කාව්‍ය
IV) සමකාලින සිදුවීමක් V) බයිබලය

(19) යථාර්ථවාදී නාට්‍ය කලාවේ පුරෝගාමියා ලෙස සලකනුයේ, ( )

I) හෙන්ඩ්‍රික් ඉබ්සන් II) ඇන්ටන් චෙකොෆ් III) ලුවී පිරැන්ඩෙලෝ
IV) විලියම් ශේක්ෂ්පියර් V) සැමුවෙල් බෙකට්

(20) තියට්‍රෝන් යනු, ( )

I) එලිසබෙත් යුගයේ ප්‍රේක්ෂකාගාරයයි.
II) පැරණි ග්‍රීක නාට්‍ය කලාව තුල මුදල් යෙදවූ පුද්ගලයා හැඳින්වූ නාමයයි.
III) නෝ නාට්‍ය ශාලාවකට අයත් අංගයකි.
IV) ග්‍රීක නාට්‍ය ප්‍රේක්ෂකාගාරය හැඳින්වූ නාමයකි.
V) හනමිචිය යන අර්ථය දෙයි.

(21) පහත නාට්‍යකරුවන් පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

A - ඇරිස්ටෝටල් B - භරතමුණි C - ඊස්කිලස් D - සොෆොක්ලීස්

E - තෙස්පිස්

I) A B C D E II) E A B C D III) A D B C E
IV) D A B C A

(22) ග්‍රීක නාට්‍ය තරඟාවලිය සංවිධානය කිරීම සඳහා රජයෙන් පත් කළ නිලධාරියා වන්නේ, ( )

I) අර්ථපති II) මජිස්ට්‍රාඩ්වරයා III) එව්රිපිඩීස්
IV) ඇරිස්ටෝටල් V) ප්‍රාන්තයේ ලේකම්වරයා

(23) 'A Doll's House' (සෙල්ලම් ගෙය/ රූකඩ ගෙදර) නාට්‍යයේ රචකයා වනුයේ, ( )

I) විලියම් ශේක්ෂ්පියර් II) තෝමස් කයිඩ් III) හෙන්ඩ්‍රික් ඉබ්සන්
IV) ස්ටැනිස්ලව්ස්කි V) ජෝන් ලයිලි

(24) සොෆොක්ලීස් විසින් රචිත නාට්‍යයක් නොවන්නේ, ( )

I) ඊඩිපස් රජ II) කොලෝනස්හි ඊඩිපස් III) ඇන්ටිගනී
IV) ලියර් රජ V) ඉලෙක්ට්‍රා

(25) ග්‍රීක කොමඩි නාට්‍යයක් නොවන්නේ, ( )

I) කුරුල්ලෝ II) නයිට්වරු III) සාමය IV) මැඩියෝ
V) සයික්ලොබ්

(26) නාට්‍යයක "ප්‍රේක්ෂාව" සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ඇරිස්ටෝටල්ගේ අර්ථකථනය වන්නේ, ( )

I) පසුතල නිර්මාණ හා රංගාලෝකයයි.
II) රංග භූමිය මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය.
III) නාට්‍යෝපකරණ හා අංගරචනයයි.
IV) වේදිකාව මත මැවෙන දෘෂ්ටිගෝචර බවයි.
V) වේෂභූෂණය හේතුවෙන් ප්‍රේක්ෂකයා අභිමුඛව මැවෙන දර්ශනයයි.

- 27 – 30 දක්වා නොගැලපෙන පිළිතුර තෝරා ඉදිරියෙන් ඇති වරහන තුල යොදන්න.

(27) රංග භූමි අලංකරණය, ( )

I) නාට්‍යයට නැතිවම බැරි අංගයකි.
II) සවි කිරිමටත් ගැලවීමටත් පහසු වන ලෙස සකස් කළ යුතුය.
III) සැහැල්ලු ද්‍රව්‍ය යොදා නිර්මාණය කළ යුතුය.
IV) ශක්තිමත් විය යුතුය.
V) නළු කාරියට බාධාවක් නොවන සේ ස්ථානගත කළ යුතුය.

(28) රංගාලෝකය, ( )

I) අඳුර පළවා හැරීම මූලික අරමුණකි.
II) නාට්‍යයේ ශෛලියට ඉඟියක් ලබා දෙයි.
III) නාට්‍යයේ කාලය හැඟවීමට යොදා ගනී.
IV) නාට්‍යයට අදාළ විවිධ ප්‍රයෝග මැවීමට යොදා ගනී.
V) අවස්ථා තීව්‍ර කර හැක.

(29) අංග රචනයේදී, ( )

I) සරල හා චරිතාංග වශයෙන් වර්ග කළ හැක.
II) නාට්‍යයක් තුල මේ සඳහා වෙනම ශිල්පියෙකු සිටී.
III) මෙය නාට්‍යයට අදාළ අනුශාංගික අංගයකි.
IV) මෙය කලාවක් මෙන්ම ශිල්පයකි.
V) මෙමගින් නාට්‍ය අයත් කාලය හඟවයි.

(30) නාට්‍ය ගීතයක හිතකර ලක්ෂණයක් වන්නේ, ( )

I) තනුවේ සරල බව.
II) සරල පද මාලාව.
III) නාට්‍යමය ගුණය.
IV) පුළුල් නාද පරාසය
V) නිර්මාණශීලිබව.

- නිවැරදි පිළිතුර ඉදිරියෙන් ඇති වරහන තුල යොදන්න.

(31) ළමා නාට්‍ය කලාවට අයත් වරණය වන්නේ, ( )

I) ළමා නාට්‍ය නිර්මාණයේදී ඔවුන්ගේ සිතුම් පැතුම්, චර්යා අධ්‍යයනය ඉතා අවශ්‍ය වේ.
II) නිශ්චිත තේමාවක් අවශ්‍ය නොවේ.
III) පසුතල අලංකරණය අත්‍යවශ්‍යම වේ.
IV) කුඩා ළමුන් රංගනයේ යෙදිය යුතුය.
V) ඉහත කිසිවක් නොවේ.

(32) රූපණය යන්නට නිවැරදි ප්‍රකාශය වන්නේ, ( )

I) රූපණය එතරම් නාට්‍යයකට අවශ්‍ය නොවේ.
II) රූපණය ශිල්පයක් මෙන්ම කලාවකි.
III) රූපණය සඳහා විශාල මුදලක් වැය වේ.
IV) රූපණය අධ්‍යක්ෂකවරයාගේ අභිමතය පරිදි සිදු කළ යුතුය.
V) රූපණය යනු නාට්‍යයට ආභරණයකි.

(33) නාට්‍ය විචාරයට අයත් නිවැරදි ප්‍රකාශය වන්නේ, ( )

I) නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් මෙන්ම ප්‍රේක්ෂකයෙකුද විය හැක.
II) නාට්‍ය කලාවට විචාරය එතරම් අවශ්‍ය නොවේ.
III) නාට්‍ය සඳහා සජීවී විචාර නොලැබේ.
IV) සෑම නාට්‍ය විචාරකයකුම විචාරක න්‍යායන් අධ්‍යයනය කර තිබිය යුතුය.
V) නාට්‍යයක් සාර්ථක වීමට විචාරයේ බලපෑමක් නොමැත.

- පහත දැක්වෙන ප්‍රශ්නවලට වරහන තුල සපයා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර ලියන්න.

(නෝරා, නත්තල් ගස, ඊඩිපස් නෙත් අන්ධ කර ගැනීම, ජුලියස් සීසර්, යොකෙස්ට්‍රා, මොල්ටාවේ යුදෙව්වා, හෙන්රි ෆොත්)

(34) රුකඩ ගෙදර නාට්‍යයේ සංකේතයක් ලෙස ................................................... යොදා ගනී.

(35) ඊඩිපස් රජ නාට්‍යයේ ........................................................ වේදිකාව මත නොපෙන්වයි.

(36) 'A Doll's House' නාටෙ‍්‍යය් දක්නට ලැබෙන චරිතයක් ලෙස ......................................... සැලකිය හැක.

(37) ක්‍රිස්ටෝපර් මාලෝ විසින් රචිත නාට්‍යයක් ලෙස ............................................... සැලකිය හැක.

(38) ඊඩිපස් රජ නාට්‍යයේ දැකිය හැකි ප්‍රභල චරිතයක් ලෙස .................................................... හඳුන්වා දිය හැක.

(39) විලියම් ශේක්ෂ්පියර් විසින් ......................................... නම් නාට්‍ය රචනා කරන ලදි.

(40) විලියම් ශේක්ෂ්පියර්ගේ ඓතිහාසික නාට්යයක් ලෙස .......................................සැලකිය හැක.

## ( II පත්‍රය ) II කොටස

### A කොටස

- එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01. I. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය කෙටියෙන් පහදන්න. (ල. 5)
II. ඇරිස්ටෝටල් දක්වන ආකාරයට ඛේදනීය වීරයා සතු විය යුතු ගුණාංග 05 ක් දක්වන්න.(ල.5)
III. ඉන් 02 ක් ඊඩිපස් රජ නාට්‍ය ඇසුරින් විමසන්න. (ල. 5)

02. I. පෙරදිග හා අපරදිග භාවිතා කරනු ලබන රංග භූමිය බැගින් නම් කරන්න. (ල. 5)
II. එම රංග භූමි 02 රූප සටහන් ඇඳ අංග නම් කරන්න. (ල. 5)
III. ඉන් එක් රංග භූමියක ලක්ෂණ නාට්‍ය ශෛලිය අනුව බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

03. I. මධ්‍යකාලීන යුගයේ නාට්‍ය වර්ග නම් කරන්න. (ල. 5)
II. ඉන් එක් නාට්‍ය වර්ගයක සුවිශේෂී ලක්ෂණ 05 ක් ලියන්න. (ල. 5)
III. මධ්‍යකාලීන යුගයේ භාවිතා කළ රංග භූමි පිළිබඳ කෙටි විමසීමක් කරන්න. (ල. 5)

### B කොටස

04. I. යථාර්ථවාදී නාට්‍යකරුවන් 02 ක් නම් කරන්න. (ල. 5)
II. යථාර්ථවාදී නාට්‍ය කලාවේ සුවිශේෂී ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 5)
III. ඉන් 02 ක් පිළිබඳ ඔබ දන්නා නාට්‍යයකින් නිදසුන් සපයමින් විමසන්න. (ල. 5)

05. I. ජුලියස් සීසර් නාට්‍යයේ රචකයා නම් කරන්න. (ල. 5)
II. ඛේදනීය වීරයා සතු ගුණාංග මෙම නාට්‍යයේ අන්තර්ගත වී ඇති ආකාරය නිදසුන් 02 ක් ලියන්න. (ල. 5)
III. එහි තේමාව පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ල. 5)

06. I. එලිසබතියානු නාට්‍ය කලාවේ ශ්‍රේෂ්ඨතම නාට්‍යකරුවන් 05 ක් නම් කරන්න. (ල. 5)
II. ඉන් එක් නාට්‍යකරුවකුගේ නාට්‍ය 04 ක් නම් කරන්න. (ල. 5)
III. එලෙස නම් කරන ලද නාට්‍ය 04 න් එක් නාට්‍යයක තේමාව විස්තර කරන්න. (ල. 5)

## පිළිතුරු පත්‍රය

## (I පත්‍රය )

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) 3 | (02) 4 | (03) 4 | (04) 2 | (05) 3 | (06) 2 |
| (07) 3 | (08) 1 | (09) 1 | (10) 3 | (11) 4 | (12) 1 |
| (13) 4 | (14) 4 | (15) 4 | (16) 2 | (17) 1 | (18) 5 |
| (19) 1 | (20) 3 | (21) 3 | (22) 5 | (23) 3 | (24) 2 |
| (25) 1 | (26) 1 | (27) 2 | (28) 2 | (29) 5 | (30) 1 |
| (31) A | (32) E | (33) B | (34) D | (35) C | (36) D |
| (37) C | (38) D | (39) C | (40) A | | |

## පිළිතුරු පත්‍රය

## (II පත්‍රය )

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) 1 | (02) 1 | (03) 2 | (04) 4 | (05) 1 | (06) 2 |
| (07) 2 | (08) 4 | (09) 3 | (10) 3 | (11) 3 | (12) 1 |
| (13) 5 | (14) 2 | (15) 1 | (16) 1 | (17) 5 | (18) 3 |
| (19) 1 | (20) 4 | (21) 2 | (22) 2 | (23) 3 | (24) 4 |
| (25) 5 | (26) 4 | (27) 1 | (28) 2 | (29) 5 | (30) 4 |
| (31) 1 | (32) 2 | (33) 1 | (34) නත්තල් ගස | | |

(35) ඊඩිපස් නෙත් අන්ධ කර ගැනීම (36) නෝරා (37) මෝල්ටාවේ යුදෙව්වා

(38) යොකෙස්ට්‍රා (39) ජූලියස් සීසර් (40) හෙන්රි ෆෝත්